(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 2(2).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා**

---

**2016 මාර්තු මස 23 වැනි බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

99/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර දෙකක කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්හි විශාල වන සංහාරයක් සිදු වී ඇති බවත්;

(ii) එම වන සංහාරයට සෘජුවම දේශපාලන මැදිහත්වීම් ඇති බවත්;

(iii) එම නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිහඬව සිටින බවත්;

(iv) මෙම වන සංහාරය ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියට මෙන්ම, දේශගුණ විපර්යාසයන්ටද සෘජුවම බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු හා නැගෙනහිර දෙපළාතට අයත් රක්ෂිත වනාන්තර කවරේද;

(ii) එම වනාන්තරයන්හි විශාලත්වය එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත වනාන්තර රක්ෂිත බවට පත් කළ වර්ෂය එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර දෙක තුළ ඉහත වනාන්තර ප්‍රදේශ තනිව හෝ කණ්ඩායම් වශයෙන් එළිකිරීම සම්බන්ධව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග, එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බලහත්කාරයෙන් අල්ලා ගත් උතුරු හා නැගෙනහිර දෙපළාතේ රක්ෂිතයන්ට අයත් ඉඩම් නැවත පවරා ගැනීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

334/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති "පුර නැගුම" ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ කවර ආයතනයක් මගින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල - ඉමදූව "පුර නැගුම" ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් යොදවා මෙතෙක් සිදුකර ඇති සංවර්ධන කටයුතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවගේ නිවාස ඇතුළු පොදු පහසුකම් සැපයීම පිණිස සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංවර්ධන අරමුදලින් මූල්‍යාධාර ලබා දුන්නේද;

(ii) එම ආධාර මුදල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතීන් කවරේද;

(iii) එම එක් එක් නිවාස ව්‍යාපෘතීන් සඳහා වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

357/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සරණාගතයින් ලෙස විදේශ රටවල පුරවැසිභාවය අයදුම්කර සිටින ශ්‍රී ලාංකිකයින්, ශ්‍රී ලාංකිකයින් ලෙස පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි අය සඳහා තානාපති කාර්යාලවල සේවය ලබාදිය යුතු බවට චක්‍රලේඛයක් තිබේද;

(iii) එම චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තු වන්නේද;

(iv) එසේ නම්, චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තුවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

365/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීමට අදාළ සාමූහික ගිවිසුම අත්සන් කිරීමට නියමිතව තිබූ දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වතු කම්කරු සාමූහික ගිවිසුම අත්සන් කිරීමට නියමිතව තිබූ දිනය පසුවී මාස 7කට අධික කාලයක් ඉක්මවා ගොස් ඇති බවත්;

(ii) වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු.1000ක් කරන ලෙස වතු කම්කරුවන් ඉල්ලා සිටින බවත්;

(iii) වතු කම්කරු සාමූහික ගිවිසුමේ දෙපාර්ශවය එකඟතාවයකට නොපැමිණ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, දෙපාර්ශවය එකඟතාවයකට ගෙන ඒමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු.1000ක් කිරීමට රජය මැදිහත්වීම් නොකරන්නේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

396/’15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 සහ 2015 වර්ෂයන්හීදී රජය විසින් ලබා ගත් දේශීය ණය ප්‍රමාණය සහ වාර්ෂික සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) 2014 සහ 2015 වර්ෂයන්හීදී රජය විසින් ලබා ගත් විදේශීය ණය ප්‍රමාණය සහ වාර්ෂික සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

406/’16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවලපිටිය මැතිවරණ බලප්‍රදේශයේ, පස්බාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඹුල්පිටිය වත්ත ඉඩමේ, කොමිෂන් සභා අනුමතිය යටතේ නීත්‍යානුකූල ක්‍රමවේදයට අනුව ගුරු ගම්මානයක් ඉදිකර ඇති බවත්;

(ii) අදාළ ගුරු ගම්මානය පිහිටුවීම සහ ඊට ඔප්පු ලබා දීම සුදුසු බව, මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති බවත්;

(iii) එම ගුරු ගම්මානයේ ඉඩම්ලාභී ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුදෙනා මේ වනවිට නිවාස ඉදිකර එම නිවාස සඳහා විදුලිය හා ජලය ලබාගෙන පදිංචි වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නව යහපාලන රජය බලයට පත්වීමෙන් පසු, රජයේ ප්‍රබල කැබිනට් අමාත්‍යවරයෙකු හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අදාළ ගුරු ගම්මානය ඉවත් කර නැවත එම ඉඩම් පවරා ගත යුතු බවට කරන ලද ඉල්ලීමට අනුව, ඉඩම්ලාභීන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

411/’16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුඩා රබර් කට්ටිකරුවන් අක්කර 1/2යේ ඉඩම්හිමි පුද්ගලයන් ලෙස සලකා සංඛ්‍යාත්මකව ගණනය කල විට ඔවුන්ට දැනට ලැබෙන ආදායම කිලෝවකට රු. 225/-ක් පමණ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය රජය විසින් ලබාදුන් රු. 300/- සහන මිල නොලැබෙන බැවින්, දළ වශයෙන් එක් කට්ටිකරුවකුට කිලෝවකින් දිනකට රු. 75/-ක පමණ අලාභයක් දැරීමට සිදුවන බවත්;

(ii) රබර් කිලෝවකට අවම වශයෙන් රු.300/-ක මිලක් නොලැබෙන්නේ නම්, අඩු ආදායම්ලාභී මෙම පවුල්වල තත්ත්වය තවත් පහළ වැටෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වර්තමාන රජය රබර් කිලෝවකට රු. 350/-ක සහතික මිලක් ලබාදීමට දුන් ප්‍රතිඥාව අනුව, එම සහතික මිල ක්‍රියාත්මක නොකරන්නේ මන්ද;

(ii) ඒ සඳහා වෙනත් සහනදායී ක්‍රියාමාර්ගයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත ආ (ii) අනුව අඩු ආදායම්ලාභී පවුල්වල තත්ත්වය තවත් පහළ වැටෙන විට ජනතාවගේ ආදායම් තත්ත්වය නැංවීම පිළිබඳව අග්‍රාමාත්‍යතුමා සිදුකළ කථාවේ නොපිට සිදුවී ඇති බවත්, එය පවුල් ලක්ෂ ගණනාවකට අහිතකර ලෙස බලපාන බවත්, ඒ ගැන රජය ගන්නා ක්‍රියාමාර්ගය ගැනත් ප්‍රකාශයක් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

414/'16

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 වන දින සිට 2015.12.31 වන දින දක්වා හිටපු හා වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට සහ ප්‍රාදේශීය සභා, මහනගර සභා සහ නගර සභා මන්ත්‍රීවරුන්ට එරෙහිව පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට (FCID) ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) පරිදි චෝදනාවට ලක්වී ඇති හිටපු හා වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ ප්‍රාදේශීය සභා, මහනගර සභා සහ නගර සභා මන්ත්‍රීවරුන්ගේ නම් සභාගත කරන්නේද;

(iii) පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් විමර්ශන අරඹා ඇති හිටපු හා වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්,පළාත් සභා මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය සභා, මහනගර සභා සහ නගර සභාවල මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම විමර්ශනවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිල්වලා ගඟේ හා ගිං ගඟේ ජලය මහ හම්බන්තොට සංවර්ධන කලාපයට ගෙන යෑමේ ව්‍යාපෘතියට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යෑමට බලාපොරොත්තු වන ජල ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ සැලසුම ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්වල පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ පාරිසරික වාර්තාවක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ව්‍යාපෘතියෙන් නිල්වලා ගඟට කරදිය මිශ්‍රවීමේ අවදානම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ හම්බන්තොට ජල ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) එම මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(iii) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iv) එසේනම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක හා විදේශ සමාගම් නම්, ඒවා අයත් රටවල් කවරේද;

(v) ඉදිරිපත් කළ ටෙන්ඩර්වල වටිනාකම් කවරේද;

(vi) ටෙන්ඩරය ප්‍රදානය කරන ලද සමාගම හා එයට හේතු කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මහ හම්බන්තොට ජල ව්‍යාපෘතිය නිසා නිවාස ඇතුළු දේපළ අහිමිවන්නන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබා දෙන සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

358/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික ප්‍රදේශවල නව නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, නිවාස ඉදි කරනු ලබන්නේ, තනි නිවාස වශයෙන්ද නැතහොත් මහල් නිවාස වශයෙන්ද;

(iii) මහල් නිවාස වශයෙන් නම්, එක් ගොඩනැගිල්ලක ඉදි කරනු ලබන මහල් සංඛ්‍යාව කොපමණද;

(iv) එක් මහලක තිබෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලයේ කොළඹ 02 කොම්පඤ්ඤ වීදිය ප්‍රදේශයේ නිවාසවලින් නිවැසියන් බලහත්කාරයෙන් ඉවත් කළ බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත (i) හි සඳහන් අය සඳහා නිවාස ලබා දී තිබේද;

(iii) නිවාස ලබා දී ඇති පුද්ගලයින් පිළිබඳ විස්තරයක් ලබා දිය හැකිද;

(iv) එසේ ලබාදී ඇති නිවාසවල වර්ග අඩි ප්‍රමාණය සහ එම නිවාසවල පහසුකම් පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(v) ඊට අමතරව එම නිවාසලාභීන් සඳහා වන්දි ලබාදීමට කටයුතු කර තිබේද;

(vi) එසේ නම්, ඒ පිළිබඳ විස්තර ලබාදෙන්නේද;

(vii) එසේ නොමැති නම්, වන්දි ලබා දීමට කටයුතු කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

372/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි පොල් රා මිලදී ගන්නා ඉස්කාගාර සමාගම් කවරේද;

(ii) එම ඉස්කාගාර සමාගම් වෙත පොල් රා සැපයීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් එක් එක් ඉස්කාගාර සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රා නිෂ්පාදකයන් වෙත බලපත්‍ර නිකුත්කර ඇති පොල් ගස් සංඛ්‍යාව එක් එක් නිෂ්පාදකයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කළුතර දිස්ත්‍රික්කයේ සිටින විනාකිරි නිෂ්පාදනය කිරීමේ බලපත්‍රලාභීන්ගේ නම් හා ලිපින කවරේද;

(v) සුරාබදු දෙපාර්තමේන්තුවට අනුව එක් පොල් ගසකින් සාමාන්‍යයෙන් දිනකට නිෂ්පාදනය කළ හැකි රා ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

397/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිය ඉන්දියානු සංචාරයේ දී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව යා කරන පාලමක් ඉදි කිරීම පිළිබඳ සාකච්ඡාවක් සිදු නොවුණු බවත්, එවැනි සාකච්ඡාවක් සිදු වුවහොත් පාර්ලිමේන්තුව දැනුවත් කරන බවත්, අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී පැවසූ බවත්;

(ii) ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයාගේ ඉන්දියානු සංචාරයේ දී ඔහු මෙම පාලම පිළිබඳ ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා සමඟ සාකච්ඡා කළ බවට ඉන්දියානු මාර්ග ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍ය නිතින් ගඩ්කාරි මහතා විසින් 2015.12.16 දින ඉන්දියානු ලෝක් සභාවට දැනුම් දුන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාලම පිළිබඳ අසත්‍ය ප්‍රකාශය සිදුකර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයාද එසේ නැතහොත් ඉන්දීය මහාමාර්ග අමාත්‍යවරයාද;

(ii) ඉන්දියාව මෙම පාලම ඉදි කරන්නේ ලංකාවේ එකඟතාවයකින් තොරවද;

(iii) එවැනි බලහත්කාර ක්‍රියාවක් හමුවේ ශ්‍රී ලංකාව ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග කවරේද;

(iv) මෙම පාලමෙන් ජාතික ආරක්ෂාවට, ආර්ථිකයට, සේවා නියුක්තියට සහ බෝවන රෝග පාලනයට ඇති වන බලපෑම අධ්‍යයනය කර තිබේද;

(v) එකී අධ්‍යයන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හිදී ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

335/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල-ඉමදූව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉමදූව මංසන්ධිය පුළුල් කිරීම සඳහා පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) ඉමදූව මංසන්ධිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත විකල්ප මාර්ගයේ දිග කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

359/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට, අපනයන ආදායමෙන් ලැබෙන මුදල කොපමණද;

(ii) එය ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) අපනයන ආදායම වැඩිකර ගැනීම සඳහා ඉලක්කයක් තිබේද;

(iv) එසේ නම්, එම ඉලක්කය කවරේද;

(v) එම ඉලක්කය සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන ආකාරය සහ කාලවකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

373/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වසර සඳහා පාසල් නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ දිනය කවරේද;

(ii) ඒ කවර රෙදි ප්‍රමාණයක් මිලදී ගැනීමටද;

(iii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම කැබිනට් පත්‍රිකාව අනුමත වූ දිනය කවරේද;

(v) ඒ අනුව ප්‍රසිද්ධියේ මිල ගණන් කැඳවීම් සිදු කළේද;

(vi) එසේ නම්, මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් හා ඔවුන්ගේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) 2016 වසර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය නිල ඇඳුම් රෙදි මිලදී ගත් සැපයුම්කරුවන් කවරේද;

(viii) මිලදී ගත් රෙදි ප්‍රමාණය කවරේද; ඒ සඳහා ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රෙදි මිලදී ගැනීම වෙනුවට පාසල් නිල ඇඳුම් වවුචරයක් ලබාදීමට තීරණය කළ දිනය කවරේද;

(ii) පාසල් නිල ඇඳුම් රෙදි 25%ක් අවභාවිත වන බවට හෙළිවූයේ යැයි අධ්‍යාපන අමාත්‍යවරයා පවසන සමීක්ෂණ වාර්තාව සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

390/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සුනාමියෙන් පීඩාවට පත් ජනතාව සඳහා සෞදි අරාබියානු සංවර්ධන අරමුදලින්, අක්කරපත්තුව, නොරොච්චොලේ ගම්මානයේ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බවත්;

(ii) එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරයේදී ප්‍රතිලාභීන් අතර බෙදාදීමට ප්‍රථමයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් අංක 178/2008 දරන නඩු නියෝගයක් මත නිවාස බෙදාදීම අත්හිටුවන ලද බවත්;

(iii) 2009/12/02 දින ප්‍රකාශයට පත්කරන ලද ඉහත නඩුවේ තීන්දුව ලබාදී වසර පහක කාලයක් ගත වී ඇති නමුත්, ඒ අනුව නිවාස බෙදාදීම සිදුකර නොමැතිවීමෙන් එම දේපළ සියල්ල මිනිස් පරිහරණයට නුසුදුසු අන්දමින් පරිහානියට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ(iii)හි සඳහන් නඩු තීන්දුව අනුව කටයුතු කිරීමට නොපමාව උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

398/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වසරේ සත්‍ය නැතහොත්, ඇස්තමේන්තු කළ දළ ජාතික නිෂ්පාදනය කොපමණද;

(ii) 2016 වසරේ පුරෝකථනය කළ දළ ජාතික නිෂ්පාදනය කොපමණද;

(iii) අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන සම්ප්‍රදායික ක්‍රමය යටතේ, වර්ෂ 2013 සිට 2016 දක්වා අයවැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන් කළ මුදල්, දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 අයවැයෙන් හඳුන්වා දුන් අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන නවීන ක්‍රමය යටතේ වර්ෂ 2013 සිට 2016 දක්වා අයවැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන් කළ මුදල් දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

412/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තේ සමඟ ඛනිජ තෙල් හුවමාරු කර ගැනීම සඳහා ඉරානය සමඟ ගිවිසුමකට එළඹිය නොහැකිද;

(ii) එලෙසම, රබර් සඳහාද එබඳු හුවමාරු වෙළඳපොළ තත්ත්වයක් ඇති කරගත හැකිදැයි විමසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේදී හා ජපානයේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණ වලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේදී හා ජපානයේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

339/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වැලි කැණීම් හා ප්‍රවාහනය තහනම් කර තිබේද;

(ii) දැනට පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වැලි කැණීම් හා ප්‍රවාහනය කිසිදු ආකාරයකින් සිදු නොවන්නේද;

(iii) එම දිස්ත්‍රික්කයේ වැලි කැණීම් හා ප්‍රවාහනය පෞද්ගලික ආයතනයකට පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) GSMB Technical Services (Pvt) Ltd. සමාගම සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය අතර ඇති සම්බන්ධය කවරේද;

(ii) එම සමාගම රජයේ ලියාපදිංචි වී තිබේද;

(iii) මෙම සමාගමෙන් සිදු කරන වෙනත් සේවාවන් කවරේද;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම් හා ප්‍රවාහනය සඳහා මෙම සමාගම තෝරාගෙන ඇත්තේ පිළිගත් ටෙන්ඩර් පටිපාටියකට අනුකූලවද;

(v) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත සමාගම, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සමඟ ගිවිසුමකට එළඹ තිබේද;

(ii) එසේ නම්, එහි කොන්දේසි කවරේද;

(iii) උක්ත සමාගමෙන් රජයට ලැබුණු බදු ආදායම කවරේද;

(iv) එම සමාගමට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම් හා ප්‍රවාහනය පිළිබඳව ඒකාධිකාරී බලය ලබාදීම තුළින් පරිසර විනාශයක් සිදු නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

360/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015දී පාසල් සිසුන්ට පාවහන් ලබාදීමට ටෙන්ඩර කැඳවනු ලැබුවේද;

(ii) ඒ සඳහා අයදුම් කළ සමාගම් කවරේද;

(iii) එම සමාගම් මූලික සුදුසුකම් සපුරා තිබේද;

(iv) සමාගම් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) පසුගිය වසරවලදී සමාගම් කිහිපයකට ලබා දුන් ටෙන්ඩරය මෙවර DSI සමාගම වෙත පමණක් ලබාදී තිබේද;

(vi) වැඩිම මිල සඳහන් ටෙන්ඩරය ඉදිරිපත් කලේ DSI සමාගමද;

(vii) DSI ටෙන්ඩරය සඳහා කැබිනට් අනුමතිය ලබා ගෙන ඇත්තේ අවම මිල යැයි සඳහන් කිරීමෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ටෙන්ඩරය, පසුගිය වසරවල සමාගම් කිහිපයකට ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ මන්ද;

(iii) පසුගිය වසරේදී DSI සමාගමෙන් ලබාගත් පාවහන් යුගල ලක්ෂ 04, එම සමාගමෙන්ම සපයා තිබුණේද;

(iv) නොඑසේ නම්, වෙනත් සමාගමකින් පාවහන් යුගල 50,000ක් සපයා තිබුණේද;

(v) එවැනි තත්ත්වයක් යටතේ, එම ටෙන්ඩරය තනි සමාගමකට ලබා දුන්නේ මන්ද;

(vi) DSI වෙත ටෙන්ඩරය ලබාදීම හරහා මුදල් වංචාවක් හෝ රජයට පාඩුවක් නොවූ බවටත් සහතික විය හැකිද;

(vii) වංචාවක් සිදු වූ බවට හෙළිදරව් වුවහොත්, වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

374/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුරය, වව්නියාව හරහා යාපනය දක්වා ඉදිකිරීමට මුලින් සැලසුම් කර තිබූ උතුරු අධිවේගී මාර්ගය, පසුව පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මුලතිව් හරහා යාපනය දක්වා ඉදිකිරීමට යෝජිත බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වව්නියාව හරහා සැලසුම් කළ මාර්ගයේ දුර, අපේක්ෂිත මුළු වියදම සහ ඉඩම් අත්පත් කර ගැනීමේදී ලබාදීමට අපේක්ෂිත මුළු වන්දි මුදල කවරේද;

(ii) පොළොන්නරුව හරහා සැලසුම් කළ මාර්ගයේ දුර, අපේක්ෂිත මුළු වියදම සහ ඉඩම් අත්පත් කර ගැනීමේදී ලබාදීමට අපේක්ෂිත මුළු වන්දි මුදල කවරේද;

(iii) මෙම අධිවේගී මාර්ගයේ එක් එක් අදියර සඳහා ණය ලබාගන්නා ආයතන, ණය මුදල හා පොලී අනුපාතියකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මුල් සැලසුම වෙනස් කරමින් මෙම මාර්ගය පොළොන්නරුව-ත්‍රිකුණාමලය හරහා සැලසුම් කිරීමට හේතු කවරේද;

(v) ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට අපේක්ෂිත කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

399/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වසරේදී ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමන්ගේ සංකල්පයක් යටතේ ආරම්භ කරන ලද දැනට ඔබගේ අමාත්‍යාංශය යටතේ පවතින සීමාසහිත පොලිප්ටෝ ලංකා (පෞද්ගලික) සමාගම විසින් 2010 වසරේ දී සාර්ථක ලෙස පොලිතීන් භාවිතා කර පෙට්‍රල් නිපද වූ බව දන්නේද;

(ii) එයින් වසර හයකට ආසන්න කාලයක් ගත වී ඇතත් පොලිතින් භාවිතා කර නිපදවන පෙට්‍රල් වෙළඳපොළට නිකුත් කිරීමට නොහැකි වූයේ මන්ද;

(iii) පොලිතින් භාවිතා කර නිපදවන පෙට්‍රල් වෙළඳපොළට නිකුත් කිරීමට අපේක්ෂා කරන වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

117/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.01 වැනි දින පුරප්පාඩු වූ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ ක්‍රමවේදය කවරේද;

(ii) උක්ත තනතුර දැරීමට සම්පූර්ණ කළ යුතු, අධ්‍යාපන හා රාජ්‍ය සේවයේ නියමිත මූලික සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014.06.02 වැනි දින ඉහත තනතුරට තාවකාලික පදනමින් අනුයුක්ත කළ ඉන්ද්‍රාණි මංගලිකා වික්‍රමනායක යන නිලධාරිනියගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඇය 2003.03.03 වැනි දින සිට 2013.02.11 වැනි දින දක්වා නිත්‍ය රාජ්‍ය සේවයේ කෙතරම් කාලයක් සේවය කර තිබේද;

(v) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කළ යුත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නිලධාරිනියට එරෙහිව මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව මගින් පරීක්ෂණයක් සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, එවැනි නිලධාරිනියකට අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ලබාදීමේ නීත්‍යානුකූල පදනම කවරේද;

(iii) අදාළ පත්වීම බල රහිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

234/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනාධිපතිවරණය පාදක කරගනිමින් 2014 වසර අවසානයේ ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව රුපියල් කෝටි 6 1/2කට ආසන්න මුදලක් වැයකොට කොළඹ කැම්බල් පිටියේ පැවැත්වූ දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ජාතික සම්මේලනය තුළින් මහජන මුදල් අවභාවිතා කර තිබේද;

(ii) මෙම සම්මේලනය සඳහා රු. 63,723,574/-ක් වැය කිරීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද; ඔහුට එවැනි අනුමතියක් ලබාදීමට බලය තිබේද;

(iii) සම්මේලනයක් සඳහා මෙතරම් විශාල මුදලක් වැය කිරීමේදී ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය කර තිබේද;

(iv) මෙම මුදල් අවභාවිතය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් යම් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(v) එසේ නම්, එම පරීක්ෂණයේ නිගමනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් සිදු කරනු ලබන විමර්ශනයන්ගේ වත්මන් තත්ත්වය කවරේද;

(ii) දිවි නැගුම දෙපාර්තමේන්තුවට අහිමි වූ රුපියල් කෝටි 06කට අධික මුදල සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයින් කවුරුන්ද;

(iii) එම මුදල අයකර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

305/’15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද රාජපක්ෂ පවුල සතුව ඩොලර් බිලියන 18ක් වටිනා විදේශ වත්කම් තිබෙන බවට විදේශ බුද්ධි අංශ අනාවරණය කරගෙන ඇති බවට විදේශ අමාත්‍යතුමා 2015 මැයි 7 දින මාධ්‍ය හමුවක දී ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) එකී තොරතුරු පොලිස් දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය කවරේද;

(iii) එම දේපළ උපයා ගත් ආකාරය පිළිබඳව මහින්ද රාජපක්ෂ මහතාගෙන් හෝ එම පවුලේ වෙනත් සාමාජිකයෙකුගෙන් ප්‍රශ්න කර තිබේද;

(iv) එකී දේපළ මෙතෙක් ශ්‍රී ලංකාවට ගෙන ඒමට පියවර නොගත්තේ මන්ද;

(v) එකී දේපළ ශ්‍රී ලංකාවට ගෙන ඒමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

348/’15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය සමයේ කොටස් වෙළඳපොළ තුළ සිදු වූ වංචා හා දූෂණ මේ වනවිටත් සිදුවන්නේද;

(ii) එසේ නොවේ නම්, ඒ හරහා ලබාගත් ප්‍රගතිය කවරේද;

(iii) සිදුකර ඇති වංචා හා දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්නේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණවල වර්තමාන තත්ත්වය කවරේද;

(v) පරීක්ෂණවලින් වැරදිකරුවන් වන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ වගකීම භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

375/’15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයින් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

413/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 අගෝස්තු මස සිට ඇහැළියගොඩ ඡන්ද කොට්ඨාසයේ ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ මල්ල නොලැබෙන බවත්;

(ii) එයට හේතු විමසූ විට, ඒ සඳහා මුදල් නොලැබුණු බව අදාළ බලධාරීන් විසින් සමූපකාරය වෙත දන්වා ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පෝෂණ මල්ල ලබාදීම සඳහා මුදල් ලබානොදීමට හේතු කවරේද;

(ii) හිඟයත් සමඟ නැවත පෝෂණ මලු ලබාදීමට නොපමාව පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතීතයේ සිට පැවත එන දේශීය වී වර්ග වගා කිරීම සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බවත්;

(ii) දේශීය පැරණි වී ප්‍රභේද වගා කිරීමේදී අවම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පාරම්පරික ක්‍රම භාවිතයෙන් පරිසරයට හා මිනිසාට සිදුවන හානිය අවම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට හඳුනාගෙන ඇති, ශ්‍රී ලංකාවේ භාවිතා කළ පැරණි වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී වර්ගයන්ගේ නම් කවරේද;

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග කවරේද;

(iv) අනෙකුත් පැරණි වී වර්ග වගා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2014 වනවිට දේශීය පැරණි වී වර්ග, බීජ වී ලෙස යොදා ගෙන වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව පුරා එම බීජ වී ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

376/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) CSN නාලිකාව ලියාපදිංචි කළ දිනය කවරේද;

(ii) එම නාලිකාව ලියාපදිංචි කළ ලිපිනය කවරේද;

(iii) එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපින කවරේද;

(iv) වර්ෂ 2012-2015 දක්වා ක්‍රිකට් තරඟ විකාශන අයිතිය ලබා ගැනීම වෙනුවෙන් CSN නාලිකාව ගෙවා ඇති මුදල කොපමණද;

(v) වර්ෂ 2005-2011 දක්වා ක්‍රිකට් තරඟ විකාශනයෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලැබූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) 2011 අගෝස්තු/සැප්තැම්බර් ඕස්ට්‍රේලියා සංචාරයේ ක්‍රිකට් තරඟ විකාශන අයිතිය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඉල්ලුම් නොකළ හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

379/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මාස 03ක කාලය ඇතුළත විශේෂ කාර්ය බලකාය විසින් දෙහිවල-කවුඩාන ප්‍රදේශයේ මෙහෙයුමක් දියත් කරනු ලැබුවේද;

(ii) එම කාලය ඇතුළත දෙහිවල-කවුඩාන ප්‍රදේශයේ නිවසකින් මරාගෙන මැරෙන බෝම්බ සමඟ පුද්ගලයින් විශේෂ කාර්ය බලකාය මගින් අත්අඩංගුවට ගෙන තිබේද;

(iii) එසේ නම්, ඔවුන් සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඔවුන්ගෙන් හෙළිදරව් වූ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙහිවල-කවුඩාන ප්‍රදේශයෙන් ISIS ත්‍රස්තවාදීන්ට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන් පිළිබඳව ගත් පියවර කවරේද;

(iii) එසේ නොමැති නම්, එසේ වූ බවට පවසන අය වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව ISIS ත්‍රස්තවාදීන්ගේ ගොදුරක් හෝ සාමාජිකයන් බඳවා ගන්නා ස්ථානයක් බවට බුද්ධි අංශ විසින් හඳුනා ගෙන තිබේද;

(ii) එසේ නම්, එයින් මිදීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

394/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 මුදල් වර්ෂය තුළදී,

(i) අපේක්ෂා කළ බදු සහ බදු නොවන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සත්‍ය බදු සහ බදු නොවන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සත්‍ය බදු සහ බදු නොවන ආදායම, අපේක්ෂිත බදු සහ බදු නොවන ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 ආදායම සමඟ සාපේක්ෂව සැසඳීමේදී, 2016 අපේක්ෂිත ආදායම කෙතරම් දුරට යථාර්ථවාදීද;

(ii) 2016 වියදම් ශීර්ෂ ආදායම සමඟ ගැලපීමේදී කපා හැරෙන වියදම් මොනවාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

400/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර ගිවිසුම සහ ඒ අනුව සකස් කරන ලද 2011 මැයි සහ 2011 ඔක්තෝබර් ප්‍රතිස්ථාපනගත සැලසුම් අනුව, ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක හික්කඩුව, බද්දේගම, නිල්ලේන (B158) මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) හික්කඩුව, ගෝනපීනුවල සහ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල බලපෑමට ලක් වූ පුද්ගලයින් හෙවත් ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පුද්ගලයින්ට වන්දි ගෙවීම් සටහන් කළ සියලුම ලාර්ක් තීන්ත සටහන් සභාගත කරන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හික්කඩුව, ගෝනපීනුවල සහ බද්දෙගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා පත්කර ඇති 5 දෙනෙකුගෙන් යුත් දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවේ (GRC) සාමාජිකයින්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු කවරේද;

(ii) ඉඩම් අත්පත් කර ගැනීම, වන්දි ගෙවීම් හා ප්‍රතිස්ථාපනගත කිරීම් සම්බන්ධයෙන් ගැටලුවක්, පැමිණිල්ලක් හෝ මතභේදයක් විසඳා ගැනීම සඳහා බලපෑමට ලක්වූ පුද්ගලයින්හට එම කමිටුව හමුවට යා හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 අප්‍රේල් මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

94/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විගණකාධිපති වාර්තා අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාව හා නොසැලකිලිමත්භාවය හේතුවෙන් රජයට අහිමි වී ඇති මුදල රුපියල් බිලියන 388ක් බවත්;

(ii) මෙම මුදලට වැට් බදු මුදල් වංචාවේ රුපියල් බිලියන 3.9ක මුදලද ඇතුළත් බවත්;

(iii) ඒ අනුව වැට් බදු වංචාවෙන් රජයට අහිමි වූ මුදල, රජයට අහිමි වූ සමස්ත මුදලෙන් ආසන්න වශයෙන් 0.5% ක් පමණක් වන බවත්;

(iv) ඉතිරි 99.5% පිළිබඳව මෙතෙක් පරීක්ෂණ සිදු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැට් බදු මුදල් වංචාව හැරුණු කොට ඉතිරි රුපියල් බිලියන 384.1ක් රජයට අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් පිළිබඳව විමර්ශනය කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම් කවරේද;

(iii) මෙම පුද්ගලයන් සම්බන්ධව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

297/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මූලික අධ්‍යාපනය සඳහා පාසලක් නොමැති වීම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අළුත් දෙන්නෑව ගම්මානයේ මුස්ලිම් දරු දැරියන් 200කට අධික පිරිසකට දුර බැහැර පාසැල්වලට යැමට සිදුවී තිබෙන බවත්;

(ii) සුදුසු මාර්ග පද්ධතියක් හෝ පොදු ප්‍රවාහන සේවයක්ද නොමැතිව, දිනපතා කි. මී. 10කට ආසන්න දුරක් ගමන් කිරීමට සිදු වීමෙන් එම දරු දැරියන් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ප්‍රදේශවාසීන් විසින් අක්කර 1½ක පමණ ඉඩමක ගොඩනැගිලි දෙකක් ඉදිකරන ලද බවත්;

(iii) එකී ඉඩම හා ගොඩනැගිල්ල රජයට පවරා ගෙන එය පිළිගත් පාසලක් බවට ප්‍රකාශයට පත්කිරීමට යෝජනා කරන ලද බවත්;

(iv) ඒ සඳහා අංක උමැප/කැකි/අසං - 01/23 II වෙළුම හා 2011.01.14 දිනැති ලිපිය මගින් කැකිරාව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට නිර්දේශයක් ඉදිරිපත් කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දුෂ්කර ගම්මානයක වෙසෙන එම දරු දැරියන්ගේ යහපත උදෙසා දෙන්නෑව ගම්මානයේ රජයේ පාසැලක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

380/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ගිං ගඟ හා නිල්වලා ගඟ පිටාර ගැලීම නැවැත්වීම සඳහා ව්‍යාපෘතියක් සකස් කර තිබේද;

(ii) එවැනි ව්‍යාපෘතියක් සඳහා චීනයේ CAMC ඉන්ජිනියරින් කොම්පැණි ලිමිටඩ් නමැති සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කොට තිබේද;

(iii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ගිවිසුමක් අත්සන් නොකර ඉහත සමාගමට 2014.12.31 දින වවුචර් අංක 2568 මගින් රු. 998,576,311/-ක් සහ 2015.01.31 දින වවුචර් අංක 99/1 මගින් රු.1003,136,336/=ක් හා වවුචර් අංක 99/2 මගින් රු. 2009,342,336/-ක් ගෙවා තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු කවරේද;

(vi) එලෙස මුදල් ගෙවා ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා 2015 අයවැයෙන් රුපියල් මිලියන 40ක මුදලක් පමණක් වෙන් කර තිබියදී මෙපමණ මුදල් ප්‍රමාණයක් ගෙවන්නේ කෙසේද;

(ii) මෙසේ ගෙවා තිබෙන මුදල සාධාරණීකරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ මන්ද;

(iv) එසේ නොවේ නම්, මේ සඳහා වගකිවයුත්තන් කවුරුන්ද;

(v) ඔවුන්ට දඬුවම් කරන්නේද;

(vi) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

401/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ ජල ජීවී ඒකකය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, අත්පත් කරගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) අත්පත් කරගෙන ඇති ඉඩම් ප්‍රමාණයේ තක්සේරු වටිනාකම කොපමණද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩම් හිමියන්ට මේ වනවිට වන්දි මුදල් ගෙවීමට කටයුතුකර තිබේද;

(ii) තක්සේරු වටිනාකම අනුව දෙවිනුවර, රස්සන්දෙනිය, එස්. එස්. ගුණසේකර මහතා වෙත වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වී ඇත්තේ මන්ද;

(iii) අදාළ වන්දි මුදල් ගෙවන දිනය කවරේද;

(iv) වන්දි මුදල් කඩිනමින් ගෙවීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවලදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණ වලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවලදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

403/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, කඹුරුගමුව රෝහලේ භෞතික හා මානව සම්පත් හිඟයක් තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් අධ්‍යයන කටයුතුවල නියැලෙන සිසු හෙදියන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) කඹුරුගමුව හෙද විදුහලේ උපදේශන කටයුතුවල නියැලෙන උපදේශකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපදේශකයින් සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

(iii) අවශ්‍ය උපදේශකයින් පත්කිරීමට කටයුතු නොකරන්නේ මන්ද;

(iv) ප්‍රායෝගික අධ්‍යයන කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු වන්නේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශාලා පහසුකම් සහ නේවාසික පහසුකම් සිසු හෙදියන්ට කඩිනමින් ලබාදීම සඳහා විකල්ප වැඩ පිළිවෙළක් යොදා තිබෙන්නේද;

(ii) දැනට පුහුණුව ලබන සෙසු හෙදියන් ගාල්ල හෝ කොළඹ හෙද විදුහල් වෙත අනුයුක්ත කර කඹුරුගමුව හෙද විදුහල නවීකරණය කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කරන්නේද;

(iii) නොඑසේ නම්, සිසු හෙදියන්ට අධ්‍යයන කටයුතු සාර්ථකව කරගෙන යාමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

409/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා ,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ධීවර සමිතියක් වෙනුවෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 750ක මුදලක් දේශපාලනඥවරියකට ලබාදී තිබේද;

(ii) ඇයගේ නම කවරේද;

(iii) එසේ නම්, එම ණය මුදල ලබාදීම සඳහා ඇපයට තබාගෙන ඇති දෑ කවරේද;

(iv) එම ණය මුදලෙන් මේ වනවිට කොපමණ ආපසු අය කරගෙන තිබේද;

(v) එසේ නොමැති නම්, දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(vi) ඒ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සභාගත කරන්නේද;

(vii) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ලබාදෙන ණය සඳහා පන්සල්වල ඔප්පු, කල්බදු ක්‍රමයට රජයෙන් ලබාගත් ඉඩම් හෝ තිරුවානා ගල් ඇපයට තබාගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?